## **ව්‍යාපාර අධ්‍යයනය - 13 - මෙහෙයුම් කළමණාකරණය**

1.මෙහෙයුම් කළමණාකරණයට අදාළව පහත දී ඇති වගන්තිවලින් වැරදි වගන්තිය තෝරන්න.

1.යෙදවුම් නිමැවුම්වලට අදාළව කරනු ලබන සියලු කටයුතු මෙහෙයුම් කටයුතු නම් වේ.
2.මෙහෙයුම් කළමණාකරණය කාර්යයන් කීපයකින් යුත් සංකීර්ණ ක්‍රියාදාමයකි.
3.ආයතනයක අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ලාභදායීව භාණ්ඩ නිෂ්පාදනය කිරීම මෙහෙයුම් කළමණාකරණයේ ප්‍රධාන අරමුණ වේ.
4.භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරවල මෙන්ම සේවා ව්‍යාපාරවලද මෙහෙයුම් කටයුතු දැකිය හැකිය.
5.පාවහන්,කිරිපිටි,සිසිල් බීම වැනි දෑ ස්පෘශ්‍ය භාණ්ඩ සඳහා උදාහරණ වේ.

2.වගුව ඇසුරින් සංකල්පය හා අදහස නිවැරදිව තෝරන්න.

| | |
|---|---|
| 1.නිෂ්පාදන ඉංජිනේරුකරණය | A - අවශ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය ප්‍රමාණයෙන් යුතුව මිලදී ගැනීම. |
| 2.නිෂ්පාදන සැලසුම්කරණය | B - යාන්ත්‍රික පාලනය,තොග පාලනය,තත්ත්ව පාලනය,නිෂ්පාදන පාලනය උදාහරණ ලෙස ගත හැකිය. |
| 3.ද්‍රව්‍ය මිලදී ගැනීම | C -නිෂ්පාදන ක්‍රියාවලිය,අවශ්‍ය යන්ත්‍රාගාර,නිෂ්පාදන කාලසටහන |
| 4.නිෂ්පාදන පාලනය | D - පවතින නිෂ්පාදිතය,නිෂ්පාදන ක්‍රියාවලිය හා සැලසුම් පිළිබඳව තොරතුරු ඒකරාශි කිරීම හා වැඩි දියුණු කිරීම පර්යේෂණ හා සංවර්ධනයයි. |
| 5.පර්යේෂණ හා සංවර්ධනය | E - අනාගත කාලයක් තුළ කුමන භාණ්ඩ,කෙසේ,කොපමණ,කවර දිනක නිපදවනවාද යන්නයි. |

1.)5D/1C/2B/4A/3E
2.)3A/5D/4B/1C/2E
3.)5A/4B/1C/2E/5D
4.)4B/3A/1C/2E/5D
5.)3A/4B/5D/2E/1C

3.)පහත දැක්වෙන්නේ නිෂ්පාදන ක්‍රමවල වාසි කීපයකි.ඒවා කාර්ය නිෂ්පාදනය,කාණ්ඩ නිෂ්පාදනය යන ඒවාට අනුපිළිවෙලින් දැක් වූ විට නිවැරදි පිළිතුර වන්නේ,

A - ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා අනුව නිපදවිය හැකිය.
B - කාණ්ඩයෙන් කාණ්ඩයට නිෂ්පාදනයේ නිමාව වෙනස් කළ හැකිය.
C - සාපේක්ෂව ඒකක පිරිවැය අඩුවේ.
D - පාරිභෝගික තෘප්තිය ඉහළ මට්ටමක පැවතීම.
E - සාපේක්ෂව තොගය විශාල නිසා පිරිවැටුම වැඩි වීම.
F - වෙළෙඳපල අවදානම අවම වීම.

1.)ADE/BCF
2.)ADF/BCE

3.)ABC/DEF
4.)BDE/AFC
5.)FCE/ADC

4.)කම්හල් පිරියත සැලසුම් වර්ග හා ඒවාට උදාහරණ නිවැරදිව ගැළපෙන පිළිතුර තෝරන්න.

| කම්හල් පිරියත සැලසුම් වර්ග | උදාහරණ |
|---|---|
| A - ක්‍රියාවලි පිරියත | E - මෝටර් රථ නිෂ්පාදන ආයතනයක් |
| B - නිෂ්පාදන පිරියත | F - පාලමක් තැනීම |
| C - කුටි පිරියත | G- ගෘහ භාණ්ඩ නිපදවන ආයතනයක් |
| D - ස්ථාවර ස්ථානීය පිරියත | H - ඇඟලුම් කම්හලක් |

1.)AE/BF/CG/DH
2.)BG/CE/AF/DH
3.)DE/CF/BG/AH
4.)AG/BE/CH/DF
5.)AE/GB/CF/HD

5.සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1.ආයතනයක තොග තුළ විශාල කාරක ප්‍රාග්ධනයක් සිර වී ඇති නිසා තොග පාලනයට විශාල අවධානයක් යොමු කළ යුතුය.
2.ඌන හෝ අතිරික්ත තොග ඇති නොවන ආකාරයට තොග රඳවා ගැනීම ප්‍රශස්ත තොග මට්ටමයි.
3.නිෂ්පාදන කටයුතු අඛණ්ඩව කර ගෙන යාම සඳහා ප්‍රශස්ත මට්ටමින් තොග පවත්වා ගැනීම තොග පාලනයේදී සිදු වේ.
4.අලෙවි කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට මෙන්ම යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රමය වැනි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් තොග පාලනය වැදගත් වේ.
5.තොග රඳවා ගැනීමේ හා ඇණවුම් කිරීමේ පිරිවැය අවම කර ගැනීම සඳහා උපරිම තොග මට්ටම ගණනය කරනු ලැබේ.

6.යළි ඇණවුම් මට්ටම ගණනය කරනු ලබන්නේ මින් කවර ආකාරයෙන්ද?

1.සාමාන්‍ය තොග භාවිතය X  සාමාන්‍ය ඇණවුම් කාලය
2.(අවම තොග භාවිතය X අවම ඇණවුම් කාලය ) + යළි ඇණවුම් ප්‍රමාණය
3.උපරිම තොග භාවිතය X උපරිම ඇණවුම් කාලය
4.අවම තොග භාවිතය X අවම ඇණවුම් කාලය
5.යළි ඇණවුම් ප්‍රමාණය - (සාමාන්‍ය තොග භාවිතය X සාමාන්‍ය ඇණවුම් කාලය)

7.පරිගණක ආධාරක නිෂ්පාදනය (CAM) නිසා ඇති නොවන ප්‍රතිලාභය කුමක්ද?

1.නාස්තිය අවම වීම.
2.සේව්‍ය සේවක සම්බන්ධතා වර්ධනය වීම.
3.නිෂ්පාදනය වේගවත් වීම.

4.ඵලදායීතාවය වර්ධනය වීම.
5.භාණ්ඩවල ගුණත්වය ඉහළ නංවා ගත හැකි වීම.

8.ව්‍යාපාර ආයතනයකට පර්යේෂණ හා සංවර්ධන කටයුතු නිසා ඇතිවන ප්‍රතිලාභයක් නොවන්නේ මින් කුමක්ද?

1.අපතය ඉහළ යාම.
2.නිෂ්පාදනයේ ගුණත්වය ඉහළ යාම.
3.පිරිවැය අවම වීම.
4.නව නිෂ්පාදන හඳුන්වා දීමට හැකි වීම.
5.පාරිභෝගිකයින් වඩාත් හොඳින් තෘප්තිමත් කළ හැකි වීම.

9.ඵලදායීතාවය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1.නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් ඵලදායීතාවය වර්ධනය කර ගත හැකිවීම.
2.නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය මැනීමට ඵලදායීතාවය යොදා ගැනේ.
3.ඵලදායීතාවය තුළින් ආයතනයක ප්‍රගතිය මැනිය හැකිය.
4.ඵලදායීතාවය ගණනය කළ විට එය 1ට වඩා අඩු වීම හිතකර වේ.
5.යෙදවුම් නිමවුම් අතර ඇති අනුපාතික සම්බන්ධතාවය ඵලදායීතාවය නම් වේ.

10.නොගැළපෙන යුගලය තෝරන්න.

1.පර්යේෂණ හා සංවර්ධන - නව නිෂ්පාදිත හඳුන්වා දීම.
2.නිෂ්පාදන පාලනය - තොග පාලනය
3.නිෂ්පාදන ඉංජිනේරුකරණය - පිරිවැය පාලනය
4.නිෂ්පාදන කාර්යයන් - ද්‍රව්‍ය මිලදී ගැනීම
5.නිෂ්පාදන සැලසුම්කරණය - කෙටි හා දිගුකාලීන නිෂ්පාදන වැඩසටහන්

<u>පිළිතුරු</u>

| | | | | |
|---|---|---|---|---|
| **1.) 3** | **2.) 5** | **3.)2** | **4.)4** | **5.)5** |
| **6.)3** | **7.)2** | **8.)1** | **9.)4** | **10.)3** |

**සකස් කළේ - කරුණා විජේසිංහ මිය,**
**ර/සුමනා බාලිකා විද්‍යාලය**